ප්‍රවෘත්තියට අදාළ කාන්තා හෝ පිරිමි පාර්ශවයේ බාහිර පෙනුම ඉස්මතු කොට දැක්විය යුතුද යන්න, එවන් පුවත් වාර්තාවන් දකින පාඨකයෙකු ඇසිය යුතු පැනයකි. මෙසේ මාධ්‍ය තුළ ඉස්මතු කෙරෙනු දැකිය හැක්කේ කාන්තා බාහිර ස්වරූපය වීමද විශේෂත්වයකි.

කාන්තා බාහිර රූපය අදාළ නොවන ලෙසින් පුවත් වාර්තාවක් තුළ දැක්වීම ඔස්සේ මාධ්‍ය බලාපොරොත්තු වන්නේ ඒ වෙත වැඩි පාඨක/ප්‍රේක්ෂක ආකර්ෂණයක් ලබාගැනීමද? කාන්තාවන් සම්බන්ධයෙන් පමණක් එය සිදුවන්නේ මන්ද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #News #Mawbima